







ශ්‍රී ලංකාවේ මුල්ම මෝටර් රථ තාක්‍ෂණ සඟරාව මෝටර්රථ නමින් 1995 ජනවාරි මස සිට ප්‍රකාශයට පත්වීම ආරම්භ වූ අතර කලාප 20 කින් අවසන් කරන ලදී. මෙය උසස් මෝටර් රථ තාක්‍ෂණය සඳහා වෙන් වූවකි.

මෝටර්රථ ආදර්ශ කලාප දෙකක්









උසස් මෝටර් රථ තාක්‍ෂණය සඳහා මෝටර්රථ සඟරාව නිකුත් වීමත් සමඟ පාඨක ඉල්ලීම මත සාමාන්‍ය මෝටර් රථ තාක්‍ෂණය සඳහාද සඟරාවක් 1996 මාර්තු මස සිට ප්‍රකාශයට පත් කරන ලදී එය නම් කෙරුණේ සිප්රථ නමිනි.

සිප්රථ ආදර්ශ කලාප දෙකක්




දමුතු තාක්‍ෂණ ප්‍රකාශන ආයතනය ලක්හඬ ගුවන් විදුලිය හා එක්ව ප්‍රකාශයට පත්කල ලක්හඬ රියසකි වැඩසටහන හා සම්බන්ධව රියසකි යන සඟරාව ප්‍රකාශයට පත් කෙරුනි. එය කලාප 50 කට පසු නතර කරනු ලැබුවේ මෙම වෙබ් අඩවිය සකස් කිරීම සඳහාය. ඉදිරියේදී නැවතත් මෙම සඟරාව වෙනත් ආරෙකින් මෙන්ම වෙනත් නමකින් නැවතත් ආරම්භ වනු ඇත.

රියසකි ආදර්ශ කලාප දෙකක්

**මෙම වෙබ් පිටුව සකසා ඇත්තේ රියසකි මාසික සඟරාවේ පළවූ ට්‍රැක්ෂන් කොන්ට්‍රෝල් වර්ග පිළිබඳව වූ ලිපි පෙළ ඇසුරිනි.**

# ඩවුන් හිල් ඇසිස්ට් කොන්ට්‍රෝල් - DAC

## DAC(Downhill Assist Control) පද්ධතිය




ඔටෝ ගියර සහිත රථයක් පල්ලමක ධාවනයේදී නියත වේගයක් පවත්වා ගැනුමට රියදුරුට ඇතිවන අපහසුතාවය

මෙය ටොයෝටා ඔටෝගියර රථවල දැකිය හැකි පද්ධතියකි. මැනුවල් ගියර සහිත රථයක් තද පල්ලමක ධාවනයේදි ඉහළ ගියරයක් යොදා ගැනුමෙන් වැඩි එන්ජින් බ්‍රේක් වීමක් යටතේ අපහසුවකින් තොරව නියත වේගයකින් රථය ධාවනය කල හැකි වෙයි. එහෙත් ඔටෝ ගියර ක්‍රමයේදි ටෝක් කන්වර්ටරය හරහා හොඳ එන්ජින් බ්‍රේක් වීමක් ලබාගත නොහැකි බැවින් මෙම සටහනේ දක්වා ඇති අයුරු රථය පල්ලමක ධාවනය කරන විට රියදුරුට රථයේ වේගය ඒකාකාරිව තබා ගැනුමට බ්‍රේක් සහ ඇක්සලරේටර පැඩල් දෙක වරින් වර පෑගීමට සිදුවෙයි. මේ අනුව රියදුරුට රථය පල්ලමක ධාවනය කිරීමට වැඩි අවධානයක් මෙන්ම මහන්සියක් දැරීමට සිදුවෙයි.




DAC ක්‍රියාකරවීමෙන් රියදුරුට නිදහසේ රථය ධාවනය කලහැකි වන අයුරු

DAC/Downhill Assist Control පද්ධතියක් සහිත ඔටෝ ගියර රථයක් පල්ලමක ධාවනයේදි පෙර සටහනෙන් දක්වන ලද අපහසුතාවය ඇති නොවෙයි. මෙයට හේතුව DAC ක්‍රමය මගින් සටහන අයුරු රථයේ වේගය නියතව සිටින අයුරු ධාවනය පවත්වා ගන්නා බැවිනි. මෙය රථයේ ස්කිඩ් කොන්ට්‍රෝල් සහිත ABS පද්ධතියේම එක් ක්‍රියාකාරිත්වයකි. මෙය ක්‍රියාකරන ආකාරය විස්තර කිරීමට තරම් ඉඩක් මෙම අවසන් සඟරාවෙන් ලබාගත නොහැකි නිසා එම පද්ධතිය පිළිබඳව අවබෝධයක් පමණක් ලබා ගනිමු.

මෙම DAC ක්‍රියාකාරිත්වය ලබා ගැනුමට කරුණු 4 ක් සම්පූර්ණ විය යුතුවෙයි. මෙය ක්‍රියාකරවීමට DAC ස්විචය ක්‍රියාත්මක කර තිබිය යුතුවෙයි. ගියර සිලෙක්ටරය L රේන්ජ් එකකට යොදා තිබිය යුතුවෙයි. ඇක්සලරේටරය මෙන්ම බ්‍රේක් පැඩලයද නිදහස්ව තිබිය යුතුවෙයි. එමෙන්ම රථයේ වේගය පැයට කි.මීටර 25 ට වඩා අඩුවිය යුතුවෙයි.